චක්‍රලේඛ අංක : ..09/2013...

මගේ අංකය: ඩබ්/08/බලපත්‍ර
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2013.02.08

සියළුම බන්ධනාගාර අධිකාරීන්/ සහකාර අධිකාරීන් වෙත,

## බලපත්‍ර මත සිරකරුවන් මුදාහැරීම/ සිරකරුවන් නිවාස නිවාඩු යැවීම

ඉහත කරුණට අදාලව බලපත්‍ර මත සිරකරුවන් මුදාහැරීම සම්බන්ධව මගේ අංකය: ඩබ්/08/ බලපත්‍ර හා 2011.12.05 දිනැතිව නිකුත් කර ඇති අංක 25/2011 චක්‍රලේඛය සහ සිරකරුවන් නිවාස නිවාඩු යැවීම සම්බන්ධව නිකුත් කර ඇති මගේ අංකය: ඩබ්/08/නි.නි./2011 හා 2012.01.18 දිනැතිව නිකුත් කර ඇති අංක 05/2012 චක්‍රලේඛය හා සම්බන්ධවයි.

02. වර්තමානයේදී ළමයින් හා කාන්තාවන් සම්බන්ධයෙන් සිදුවන අපරාධ සංඛ්‍යාත්මකව වැඩිවෙමින් පවතින බවට සමාජ මතයක් හා දැඩි විරෝධයක් සමාජය තුල පවතින බැවින් එවැනි වරදකරුවන් සම්බන්ධයෙන් සහන ලබාදීම තවදුරටත් එම අපචාරී ක්‍රියා වර්ධනය වීමට හේතුවිය හැකිබව පෙනී ගොස් ඇත. එම තත්වයන් පාලනය කිරීමේ එක් පියවරක් වශයෙන් මෙවැනි වරදකරුවන් බලපත්‍ර මත මුදාහැරීම හා නිවාස නිවාඩු යැවීම තාවකාලිකව අත්හිටුවීමට පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යතුමා විසින් තීරණය කර ඇති බවත් මින් ඉදිරියට එපරිදි කටයුතු කරන ලෙසට පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් අංක MRPR/03/05/02/10 හා 2013.01.11 දිනැති ලිපියෙන් උපදෙස් දී ඇත.

03. එපරිදි ක්‍රියාකිරීමට 2013.01.18 දිනැතිව කැඳවූ බලපත්‍ර රැස්වීමේදී ද තීරණයට එළඹුනි.

04. ඒ අනුව

1. මගේ අංකය: ඩබ්/08/බලපත්‍ර හා 2011.12.05 දිනැතිව නිකුත් කර ඇති ඉහත කී අංක 25/2011 චක්‍රලේඛයේ 06 වන වගන්තිය <u>පමණක්</u> මින් අවලංගු කරමි. එම 06 වන වගන්තිය මෙසේ පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

" ස්ත්‍රී දූෂණ/ළමා අපචාර සම්බන්ධයෙන් සිරදඬුවම් ලබා ඇති වරදකරුවන් මින් ඉදිරියට බලපත්‍ර මත මුදාහැරීම සිදු නොකෙරේ". යනුවෙනි.

11. මගේ අංක ඩබ්/08/නි.නි./2011 හා 2012.01.18 දිනැතිව නිකුත් කර ඇති ඉහත කී අංක 05/2012 චක්‍රලේඛයේ අංක 01 වගන්තිය පමණක් මින් අවලංගු කරමි. එකී වගන්තිය <u>පමණක්</u> පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

"මින් ඉදිරියට ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර සම්බන්ධ වරදකරුවන් නිවාස නිවාඩු යැවීම සිදු නොකරන අතර නව සංශෝධනයට යටත්ව බලපත්‍ර මත මුදාහැරීමට සුදුසුකම් ලබන අනිකුත් වරදකරුවන් පමණක් මගේ අංක : ඩබ්/08/බලපත්‍ර හා 2011.12.05 දිනැතිව 25/2011 චක්‍රලේඛයේ අනිකුත් කොන්දේසි ප්‍රකාරව නිවාස නිවාඩු යැවීමට සලකා බැලේ." යනුවෙනි.

මින් ඉදිරියට මෙකී නියෝග තරයේ පිලිපදිමින් ක්‍රියා කරන ලෙසට ඔබගේ සුභසාධක නිලධාරීන්ට උපදෙස් දෙන මෙන් දන්වමි.

(අත්සන)

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත්:

01. ලේකම්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය } දැන ගැනීම පිණිස

02. සභාපති, බලපත්‍ර මණ්ඩලය